PADAVINISA

OR

The Grammar of the Sinhalese Language.

PREPARED BY

M. C. PERERA

HEAD MASTER,

Vernacular Mixed School, Sedawatta.

APPROVED BY

A. L. Samerewikrema Esquire

Senior Assistant Inspector of Schools.

PUBLISHED BY

Don Abraham Wanigasuriya Appuhamy.

පදවිනිස

හෙවත්

සිංහලභාෂාවේ ව්‍යාකරණ.

සේදවත්තේ මිශ්‍ර පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍ය

ඇම්. සී. පෙරේරා මහතා

විසින්

සම්පාදනයකරනලදී.

ඒ. ඇල්. සමරවික්‍රම

පාඨශාලා උප ප්‍රධාන පරීක්‍ෂක මහතාණන්

විසින්

පසක්නාලදි.

දොන් ඒබ්‍රහම් වණිගසූරිය අප්පුහාමි

විසින්

මුද්‍රණය කරවනලදී.

1901.

Price 10 Cents. මිළ ශත 10 යි.

PADAVINISA

OR

The Grammar of the Sinhalese Language.

PREPARED BY

M. C. PERERA

HEAD MASTER,

Vernacular Mixed School, Sedawatta.

APPROVED BY

A. L. Samerewikrema Esquire

Senior Assistant Inspector of Schools.

PUBLISHED BY

Don Abraham Wanigasuriya Appuhamy.

පදවිනිස

හෙවත්

සිංහලභාෂාවේ ව්‍යාකරණ.

සේදවත්තේ මිශ්‍ර පාඨශාලාවේ ප්‍රධානාචාර්‍ය්‍ය

ඇම්. සී. පෙරේරා මහතා

විසින්

සම්පාදනයකරනලදි.

ඒ. ඇල්. සමරවික්‍රම

පාඨශාලා උප ප්‍රධාන පරීක්ෂක මහතාණන්

විසින්

පසස්නාලදි.

දොන් ඒබ්‍රහම් වණිගසූරිය අප්පුහාමි

විසින්

මුද්‍රණය කරවනලදි.

1901.

PREFACE.

This little treatise "Padavinisa" was compiled during our school days by our tutor, Mr. M. C. Perera, for the use of the students of the lower Standards at the Government Mixed School at Sedawatta. We read this book in the Fourth and Fifth Standards and used other works from the Sixth Standard upwards. The practical use we have made of this small treatise and the advantages we have derived therefrom have induced us to place it in the hands of the rising generation of students. In publishing it we hope that the teachers of Vernacular schools will encourage our efforts by using it in their classes.

We would also state here with much pleasure that the Right Rev. **Dharmakirti Sri Dharmarama** Thero. High priest of Colombo and Chilaw and Principal of Vidyalankara College Peliyagode has approved of this compilation.

SEDAWATTA,
15th December 1901.

Don Abraham Wanigasuriya.

විඥාපනය.

සේදවත්තේ ආණ්ඩුවේ ස්වභාෂා මිශ්‍ර පාඨශාලාවේ අප ඉගෙන ගන්නාකල පහළ පඞ්ක්තිවල ළමයින්ගේ ප්‍රයෝජනය සඳහා අප ඇචාය්‍ය්‍ය ඇම්. සී. පෙරේරා ගුරුතුමන් විසින් "පදවිනිස" නම්වූ මෙම කුඩා පොත ලියනලද්දේය. හතරවෙනි පස්වෙනි පඞ්ක්ති දෙකේදී අපි මේ පොත කියා හවෙනි හත්වෙනි අටවෙනි පඞ්ක්තිවලට පැමිණී පසු අනිකුදු ව්‍යාකරණ පොත් භාවිතකෙළෙමු. එයින් අපට ලැබුණු පහසුවද ප්‍රයෝජනයද අත්දුටුනිසා මේ පොත අපේ අධුනික බාල පරම්පරාව අතටද පත්කරවන අදහසින් මෙසේ ප්‍රසිධකෙළෙමු. එහෙයින් සිංහල පාඨශාලාවන්හි ආචාය්‍ය්‍යවූ ගුරුවර මහතුන් විසින්ද සාදරයෙන් මෙය ප්‍රතිග්‍රහණයකොට පාඨශාලාවල භාවිතකරවන්නුලැබේනම් අප්‍රමාණ ප්‍රයෝජන ලැබිය හැකි බව මතක්කරමු.

තවද මෙය ප්‍රකාශකරවීම සඳහා මෙම ග්‍රන්‍ථකතෘවූ අප ගුරුතුමා විසින් ස්වකීය ආචායේ‍ය්‍යාත්තම විද්‍යාලංකාර පරිවෙණාධිපති පණ්ඩිතාචාය්‍ය්‍ය **රත්මලානේ ධම්මකිත්ති ශ්‍රීධම්මාරාමාභිධාන** කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධාන නායක ස්ථවිර ස්වාමිපාදයාණන්වහන්සේගේ කරුණාධාර අවසරය ලබාදුන් බවද ඉමහත් සතුටින් සඳහන්කරම්හ.

1901 දෙසැම්බර් 15 දින
සේදවත්තේදීය.

මෙවගට,

දොන් ඒබ්‍රහම් වණිගසූරිය.

PADAVINISA.

පදවිනිස.

සතර පද සිය පත—සඳ උතුමඟ අඳරින්
කරනෙම් පද විනිස එළි—වියරණ උගනුවන්වස්.

LETTERS.

අකුරු.

1 අ ඉ උ එ ඔ විලු—ලුහු පණකුරු පසෙකි හෙද
ආ ඊ ඌ ඒ ඕ—ගුරු විසින් දසයෙක් වේ.

2 ක ග ජ ට ඩ ණ ත ද න—ප බ ම ය ර ල ව ස හ ළ
අං මෙව්සි ගතකුරු නම්—උපදනා තැන් එ මෙසේ.

3 ගල තොල් මුදුන දත්—තල්ල නැහැ මේ සතැනින්
උපදිත් ඒවියු වණතිස-එ කොමෙන් දනුව වෙනවෙන.

4 එහි ව ද න ස ල දත්—ඉ ය ජ තලු අ ක ග හ ගලැ
උ ප බ ම තොල්හි අං නැහැ-ට ඩ ණ ර ළ වෙති මුදුනේ.

5 ඒ ගල තලු දෙතැනෙහි—ගල තොල් දෙතැන්හි ඕ
ව යනු දත් තොල් දෙතැනෙහි-තිපදිති විසූ පඬුවෝ.

PARTS OF SPEECH.

පද.

6 අරුත් පළකරනා—අකුරු පද නම් වන්නේ
නම් කිරිය උපසග හා—නිපායයි හෙද සිව්වේ.

7 "සතර උගනිච් ඉති"—යන සතර පද පිණොවින්
කොමෙන් නම් උපසග හා—කිරියද නිපා දන්නේ.

NOUNS.

නම් පද.

8 ලිඟු විබත් බස් හැම—සෙව්නා සදන් තමවෙත්
නමනා හෙඪින් අරුතන්—නම්පද නමැයි පවසත්.

9 "සත්නට සතර හා—සමවන ලොව වතෙක් නැත්"
මෙහි 'සත්නට සතර ලොව-වතොක්' මෙසතර නම්පද.

Verbs.

කිරියපද.

10 තුන්කල් තුන්පුරිස්—දෙබසින් යුතු සකරුනෙන් ලූවචා සිදුවූයේ—කිරියපද නම් වන්නේ.

11 “බත පිසි රජවෙයි—සුව විඳින්නෙමි” යන මෙහි ‘පිසි වෙයි විඳින්නෙමි’ යනු—කිරියපද බැව් දන්නේ.

Prepositions.

උපසග පද.

12 නම් හෝ කිරිය මුල—සබඳව වෙසෙස් අරුතක් පළකරන අකුරක් හෝ—දෙකක් උපසග පදවේ.

13 “සුසිරිත පිළිගනිව්”—මෙහි “සිරිතය ගනිව්” යන නම් කිරිය දෙක මුල දිසි—‘සු පිළි’ යනු උපසග වේ.

14 අනු උ පිරි ස ප නි දු—අති පි පස් පර උප අවි අප පිළි අදි සු අව අබි—යනුවෙන් එවිසිබේ වේ.

Particles.

නිපාපද.

15 පද මුලග මැද ගී—නා තරුත් පළකරනුයේ නිපාපද නම් වේ ඒ—මෙපියොවින් දැනගන්නේ.

16 “අද යාළුයුතුම වැඩ—සෙටට කල්නොදමනු” මෙහි ‘අද ම නො’යි කී මේ තුන-නිපාපද නම් වන්නේ.

17 වනාහි තෙක් අනේ—එම්බා පිණිස හා හෝ මැ ලු වැනි එද නම් වෙන—යම්සේ මෙද නිපා වේ.

Elision.

ලොප්.

18 පෙදෙක මුල මැද අග-කොතැනක නමුත් සිටි කුරු අකුසුරුවනු හෙවත් ඒ-නැතියරනු ලොප් නම් වේ.

19 “හැරගෙන පුරඅඟනා—බානු” මෙහි මුල මැද අග වණලොප් විසින් සිදුවෙයි—‘රගෙන පුරගනා බා’ යි.

Substitution.

අදෙස්.

20 ගම් පෙදෙක අකුරක්-නැතිකොට අනික් අකුරක් ඇතිකරනු ඒ සඳහා—අදෙස් වේ ඒ සතුරෙව්.

21 "සැරිපුත් සුදු සුගඳ"—මෙහි ප ස ග කුරු ලොප්වී
යහවණ් අදෙස්වීමෙන්—'සැරියුත් හුදු සුවඳ' වේ.

AUGMENTATION.

අ ග ම්.

22 තිසි අකුරක් පෙදෙක—නොලොපා ඒ ඈසුරුකොට
වනුයේ අගම් නම්වේ—මිතුරතු සඳිසි වේ ඒ.
23 "නොඑක් තුසුඅග"මේ-දෙපෙදෙ පරසරකුරු දෙක
ඈසුරුකොට යවගම්වී-සිදුවෙයි 'නොයෙක් තුසුවග.'

FORM OF THE PRECEDENT LETTER.

පෙ ර රූ.

24 පෙර පෙදෙහි අගසිටි—ගතකුර රුවම පරපෙදෙ
මුල ගතකුරට වූවහොත්—එපෙරරූ නම් වන්නේ.
25 'කම්හල' මෙදෙපෙදින්—හල යන පෙදෙහි මුල සිටි
හකරට පෙර මකරරුව—අදෙස්වී 'කම්මල' වේ.

REDUPLICATION.

දෙ රූ.

26 එක් ගතකුරක් හෝ—කිරිය ඈ යම් පදයක්
රූ දෙකක් ඒ විලසින්—වූව හොත් දෙරූ නම්වේ.
27 'උකුසු පල' යන්නෙහි—සපල යනු රූ දෙක වී
'උකුස්සා පල පල' යී—සිදුවේ දෙරූවිදියෙන්.

METATHESIS.

පෙ ර ළි.

28 පිළි වණ පද විබත්—කිරිය යනා මේ පිළිබඳ
සියබසැ පස් පෙරළි වේ—පාමි ඒ එකිනෙක දැන්.

METATHESIS OF VOWELS.

පි ළි පෙ ර ළි.

29 පදයක පළමු තුබූ—පණකුරක් සඳහා අන්
පණකුරක් නිසිලෙස වී—සිදුවනු පිළිපෙරළි වේ.
30 'උයෙන රුක්' මෙදෙකෙහි—මුලසර ඉයනු වීමෙන්
'ඉයෙන රික්' යී සිදුවනු—පිළිපෙරළි විදියෙන්මැයි.

METATHESIS OF CONSONANTS.

ව ණ පෙ ර ළි.

31 පෙදෙක ඇති ගතකුරු—දෙකක් ඔබ මොබ පෙරළි
ලැකියනුසරින් සිදුවනු—වණපෙරළි නම් දන්නේ.
32 'එරඹු කෙළවර' මෙහි—රඹළර වණෑන් දෙඅතට.
පෙරළි 'එඹරු කොරවළ'—කියා එකොමෙන් සිදුවේ.

METATHESIS OF WORDS.

ප ද පෙ ර ළි.

33 ළඟ ළඟම තිබෙනා—එකට පිළිබඳ දෙපදක්
ඔබමොබ රුගෙන සලයනු-පද පෙරළි නම්වන්නේ.
34 'අමුණු තුන්' යන මේ—එකට පිළිබඳ පද දෙක
දෙයතට වැටී 'තුනාමුණු'—කියා සිදුවන සේ දන්.

METATHESIS OF THE CASES OF NOUNS.

වි බ ත් පෙ ර ළි.

35 පදයක් යෙදියයුතු—යම් විබතකින් නොයොදා
අනිකකින් සැලසුවහොත්—එවිබත් පෙරළි නම්වේ.
36 "අද මව් පිය දෙදෙනා—ඔහු වයනබව නොම දැන
කති වෙණ මීයනා—සුදූයයි අත ගැඹු සැකයෙනා."
37 මෙහි 'මීයෝ' සී පෙර—විබතින් යෙදියයුතු පද
'මීයනෑ'සී කතු විබතින්—යොදනු එපෙරළියෙන් වේ.

METATHESIS (*of the Moods and tenses*) OF VERBS.

කි රි ය පෙ ර ළි.

38 වත්මන් ඇ කිරිය—පස යෙදියයුතු කිරියක්
අනා ඇ යම් පසකින්—යොදනු කිරිය පෙරළි නම්.
39 "මේ ගුත්තිල ඇදුරු—කෙළෙහි තෝ දුන් තට ගුරු
එබැවින් තගෙ නිසරු-තෙපුල් කෙලෙසක නොවන්නෙද බොරු."
40 මෙහි වත්මන් කලින්—'නොවේදූ'සී කියයුතු පද
අනා කිරියට පෙරළා-'නොවන්නෙද'කී එකොමෙන්.

ELONGATION OF THE VOWEL SOUNDS.

වැ ඩි.

41 උසුරුවන පදයෙක—මත් වැඩි කරනු.වැඩි නම්
දෙමතැති 'පෙළ' යන්න ඉන්-'පේළ'සී තෙමතින් යෙත්.

ABBREVIATION OF THE VOWEL SOUNDS.

අ ඩු.

42 පදයෙක මත් ගැණනා—අඩු කරනු අඩු නම් වේ
තෙමනැති 'බම්බු'යනු ඉන්-දෙමත්කොටයෙත් 'බඹු'යි.

43 තිමෙස් කල් පමණක්—හෝ ඇසිපිය හෙළනපොෂ
උසුරුවනා අකුරක් එක්—මත්නමැයි සලකත්තේ.

(DISCUSSION ON) THE LETTER 'හ' (H)

හ කා ර වි නි ස.

44 "අදෙස් අගම්විදි—පියවි සබඳ හකාරන්
වෙසෙසා හැදිනැ යොදනු-උගහා නොදැහැ ඇදුරන්"

SUBSTITUTION OF THE LETTER 'හ' (H)

අ දෙ ස් හ කා ර.

45 පෙදෙක ඇති සකාරක්—ලොප් කොට්න් ඒ සඳහා
යෙදුවහොත් හකාරක් ඒ—අදෙස් හකාරයි නම් වේ.

46 'සොඳ උස කෙසෙල් ගස'—මෙ පදන්හි සකරන්හට
හකාර අදෙසවැ 'හොඳ උහ-කෙහෙල්ගහ'වූබැව් දත්.

AUGMENTATION OF THE LETTER 'හ' (H)

අ ග ම් හ කා ර.

47 පෙර නොමැති හකාරක්—යම් තිසි පදතුරෙක්හි
සරඇසුරුකොට බුහුණු—වනුයේ හකාරගම් නම්.

48 'සඳම් ඉදු සිදුඅත්'—මෙපදන් හකාරගම් වී
'සඳහම් ඉදුහු සිදුහත්'—වහරෙහි ලොවැ පළට වේ.

THE LETTER 'හ' (H) IN RADICALS.

පි ය වි හ කා ර.

49 අදෙසැ විදියකින්—බැහැරින් හකාර සුහුණුව
පෙරපියොවින්ම සිටි ඒ—පියවි හකාර වන්නේ.

50 'හමළ වෙහෙසා ලුහු'—මෙතුන් පදයෙහි දිස්නා
මුලමැදග හකාරන් හැම—පියවි සබඳ නම් වේ.

COMBINATION.

ස ඳ.

51 දෙපදයක අක්මුල්—අතර නැති සේ ලංකර
පෙර පර වණන් ගළපනු—සඳ නම් ඒ මෙසේ වේ.

52 පෙරසරලොප් පර—සරලොප්ද සර සරදෙස්
ගතදෙස් පෙරරු ගතකුරු-ලොප් අගම් දෙරුසඳවෙත්.

COMBINATION BY THE ELISION OF THE LAST VOWEL OF THE FIRST WORD.

පෙරසරලොප්සඳ.

53 සඳවන දෙපදයෙන්—මුල පෙදෙහි අග සරකුර
ලොප්කොට ගැළපුවහොත්-එපෙරසරලොප්සඳවේ.

54 'දිගු+ඇස්' යන මෙපද—දෙකින් පෙරපෙදෙ අග සර
ලොප්කොට පර පෙදෙහි මුල-සර ගැළපූව'දිගැස'වේ.

COMBINATION BY THE ELISION OF THE FIRST VOWEL OF THE SECOND WORD.

පරසරලොප්සඳ.

55 සඳවන පදදෙකින්—පර පෙදෙහි මුල සරකුර
ලොප්කොට සිදුකරනුයේ—පරසරලොප්සඳැයි දන්.

56 'මැති+උතුමා' මෙපද—දෙකින් උතුමා යන්නෙහි
මූල සරකුර ලොප්ව ඒ—'මැතිතුමා'යි සඳ වේ.

COMBINATION OF VOWELS.

සරසඳ.

57 දෙපෙදින් පර පෙදෙහි—මුල සරකුර පෙරවූ සිටි
ගතකුර ඇසිරැ වන්නේ—සරසඳ නමින් පළවේ.

58 'එකින්+එක' මේ පද—දෙකින් පරපෙදෙ මුලසර
පෙරපදත ගතකුර හා-ගැළපූවොත්'එකිනෙක'වේ.

COMBINATION BY THE SUBSTITUTION OF VOWELS.

සරදෙස්සඳ.

59 සඳවන තැන දෙපස—සර දෙකටම සරක් අන්
අදෙසකර ගළපනුයේ—වේය සරදෙස් සඳනම්.

60 'සහ+උදර' මේ දෙක—අතරෙහි අ උන් ලොප්වී
ඕ යන සර එසඳහා—අදෙසව 'සහෝදර' වේ.

COMBINATION BY THE SUBSTITUTION OF CONSONANTS.

ගතදෙස්සඳ.

61 දෙපදයක් සඳවන—තැන්හි ඇති ගතකුරකට
ගතක් අදෙසවූවනුයේ—වේය ගතදෙස් සඳ නම්.

62 'පිළි+කම් කැසුබු+පොතු'—කබන් හට මෙපදන්හි
යපන් අදෙසවැ 'පිළිසම්—කැසුප්පොතු' යි සදවේ.

COMBINATION BY ASSIMILATION OF THE PRECEDENT LETTER.

පෙ ර රූ ස ඳ.

63 පර පෙදෙහි මුල සිටි—ගතකුරට පෙර පදයෙහි
අගැති ගතකුර රුව ගී—වන්නේ පෙරරූ සඳනම්.
64 'විශ්+කම්' මේ දෙකින්—පරපෙදෙහි මුල ක කරට
පෙරපෙදෙ සකරරුව ගී—'විස්සම්' කියා සදවේ.

COMBINATION BY THE ELISION OF CONSONANTS.

ගතකුරුලොප්සඳ.

65 පෙර පෙදෙහි අග ඇති—ගත සර සමග ලොප්වී
මත්වැඩිව ගැළපෙන්නේ-ගතකුරු ලොප්සඳැයි දන්.
66 'නෙළුඹු+මල්' මෙදෙකින්—පෙරපදතැ ගත සරසහ
ලොප්ව මත් වැඩියෙන් ඒ—සඳ වූව 'නෙළුම්මල්' වේ.

COMBINATION BY AUGMENTATION.

අ ග ම් ස ඳ.

67 යව ඈ ගතකුරන්—පරපෙදෙහි මුල සරකුර
ඇසුරුකොට ගැළපෙනසඳ—අගම්සඳ නම් වන්නේ.
68 'පිරි+අත් රූ+අරූ—පුත+උත්' මෙතුනැ පරපද
යවරන් ඇසිරු 'පිරියත්—රූවාරූ පුතරුත්' වේ.

COMBINATION BY REDUPLICATION.

දෙ රූ ස ඳ.

69 පෙරපදතැ ගතකුර—සර ලොප් නොවින් එගතම
දෙරූ කැරැ පර සර හා—ගැළපුව දෙරූසඳ වේ.
70 'හෙළිලි+අඹු' මෙදෙකින්-හෙළිලි යන්නෙහි අග සර
ලොප්ව දෙරුවී අඹු හා—ගැළපී 'හෙළිල්ලඹු' වේ.

PRONOUNS.

සව්නම්.

71 හෙළදිව් බස සියල්—දූයටම වහර කළහැකි
එ මෙ ඈ දෙලිඟු සඳහණ—දැනගනුව සව්නම් බැව්.
72 රජ යෙයි, ගහ පෙරෙයි—ගල බිඳෙයි, එ කවර රජ
ගහ ගලද කියහැකි වේ—හැමට 'ඒ' යනු නිදසුන්.

73 පෙර යම් අනික් හෝ—ළඹ හැම කවර ඒ මම්
අපි සියලු පර මේ ඈ—පද සර්වනාමින් සිද්ධවේ.

GENDER.

ලිඟු.

74 පිරිමි බැව් පළවන—සියලු නාම් පුම්ලිඟු වේ
එලෙසම ඉතිරි ලිඟු නම්-ගැහැනු බැව් හඟවනසද.

75 බමුණා, නටන්නා—වඳුරා, මුහුද, ඈ මේ
පිරිමි බැව් පළවනපද—බැවින් පුම්ලිඟුසද වේ.

76 බැමිණී, නටන්නී—වැඳිරී, ගඟ, මෙ ඈ සද
ගැහැනුබැව් පළකරනෙන්--ඉතිරිලිඟු නම් දන්නේ.

SINGULAR NUMBER.

එකබස.

77 යම් කිසි පදයෙකින්—එක්සතකු හෝ වෙනයම්
දෑයක් හඟනේ නම් ඒ—පදය එකබස නම් වේ.

78 සතුරා, බෙහෙත, මේ—දෙපෙදින් එක්සතකු හා
එක්දෑයක් පළවන්නෙන්—එකබසැයි එපදන් දන්.

PLURAL NUMBER.

බහුබස.

79 යම්පදයකින් එක්—සතක්හට හෝ දෑයකට
වැඩියක් හැඟෙන්නේනම්—එ බහුබස්නම් දන්නේ.

80 සතුරෝ, බෙහෙත්, මේ—දෙපදයෙන් එකකුට හා
දෑයකට වඩා පළවන—බැවින් ඒ බහුබස් වේ.

CASE.

විබත්.

81 නාමරූත් බවට නම්—යොදනුව හෙවත් බෙදනුව
ගළපන. අකුරු ඒ අග—විබත්නම් වේ හෙමෙණේ.

82 'රජුගේ පිරිස්' මෙහි—හිමිබව හඟවනරූතට
බෙදනුව ගැළපූ 'රජ' හා—'උගේ' යනු විබතැයි දන්.

83 පෙර කම් කතු කරණ—සපදන් අවදි සබඳද
අදරද අලප් මෙ කෙමෙන්—සිඟබසැ නාව විබත්වේ.

Nominative Case.

පෙර විබත්.

84 වුතුඅත හෙවත් පර—කිරියෙන් උසුරුවන්නක්
පෙර විබත් යන්නේ වේ—ආ ඕ ඇ පයන් දත්.

85 'නිරිඳු රට රැකී'—මෙහි රැකී යන කිරියෙන්
උසුරුවනුලැබූ නිරිඳු—පෙරවිබත් සෙවිනේ වේ.

Accusative Case.

කම් විබත්.

86 කතු විසින් සපයන—කිරිය හා බැඳී පදරුත
කම්විබත් නම් වන්නේ—අ ආ උන් අන් ඇ පස.

87 'බඹා ලොව මැවිදු'—මෙහි මැවී යන කිරියට
බැඳුණු 'ලොව' යන පදරුත-කම්විබත් නම් දන්නේ.

Instrumental Case.

කතු විබත්.

88 මෙහෙයුම් නොලැබ හෝ—ලැබ කිරියක් කරන්නා
කතුවිබත් සෙවිනේ වේ—පස අ ආ අන් උන් ඇ.

89 'මුනිඳුන් දෙසූ බණ'—මෙහි දෙසූ යන කිරියෙහි
කතු මුනිඳු නිසා ඒ—'මුනිඳුන්' යනු කතුවිබත්.

Auxiliary Case.

කරණ විබත්.

90 කිරියක් කරන්නාට—කතුට ඉවහල් වන්නක්
කරණ විබතින් යොදනේ-ඉන් එන්නෙනැ පස වේ.

91 "හෙතෙම බොරු කැකුලෙන්--ඇවිදී" මෙහි කතුට ඒ
කිරිය කරනාට ඉවහල්—'කැකුලෙන්' යනු කරණ නාම්.

Dative Case

සපදන් විබත්.

92 දෙනා දෑ ලබන අය—හහවන්නෙද පිණිස හා
එක්වනුයේද සපදන්—ආට උන්ටැ පස වේ.

93 "යදිකාට දන් දෙයි—සැප පිණිස කය වෙහෙසවි"
'යදිකාට සැප' යන මේ—දෙපදයම සපදන් වේ.

Ablative Case.

අවදි විබත්.

94 යමකින් පහළවෙනම්—කිරියට ඉමක්වේනම්
ඒ අවදිකරුනම් වේ—පස ඉන් එන් අගෙන් ඈ.
95 'මුවනැකින් කස්තුරි—ගනිත්' මෙකිරිය පවතින
ඉම වූයෙන් නැකින් යනු—අවදිවිබතැයි දන්නේ.

Genitive Case.

සබඳ විබත්.

96 ඔවුනොවුන් පිළිබඳ—දෙසින් වෙසෙසන වතහෝ
යමක හිමියා සබඳය—අගේ උන්ගේ ඈ පස.
97 "අඟනුන්ගේ තුඟුණ—ඔතුට දනයක් නැත" මෙහි
'අඟනුන්ගේ ඔතුට' මේ—දෙපදය සබඳනම් වේ.

Locative Case.

අදර විබත්.

98 කතුකම් දෙකට බැරි—කිරියක් දරන්නේ හෝ
කිරියට අදර වන්නේ—අදරනම් පස එ හි ඈ.
99 'සක් සදෙහි සසලප —ඇදී' මෙකිරිය දැරුයේ
යදය එහෙයින් 'සදෙහි'—යන මේ අදරනම් වේ.

Vocative Case.

අලප් විබත්.

100 කිසිවකු අබිමුවට—කැඳවනුව කියනා නම
බජනේ අලප්නම් වේ—අ ආ ඉනි එනි ඈ පස.
101 'දරුව මෙහි එව' වේ—වැකියෙහි වූ 'දරුව' යනු
අබිමුවට කැඳවන්නට—කියෙන් ඒ අලප් නම්.

Compound Words.

සමස්.

102 වෙන වෙන අරුත ඇති—දෙපදයක් හෝ වැඩියක්
එකරුතක් පළවනසේ—ගළපනු සමස්නම් වේ.
103 සතෙක්වූ 'මුව' යනු—දැයක් කියවෙන 'මස්' හා
ගැළපුමෙන් 'මුවමස්'යි—මුවාගේ මස් පළවේ.
104 විබතුවිය දඅරුත්—වෙසෙසුන් අන් අරුත්වී
සිංහබසැ සමස් මෙකොමෙන්-පස්වැදෑරුම් කෙමෙනේ.

CASE COMPOUNDS.

විබත් සමස්.

105 පෙර අලප් දෙවිබත—හැර සෙසු විබතරුත් පද
අන් සද සමග සබඳව—එ විබත්සමස් සෑදේ.

106 කම් අදරරුත්හි—'ගො පොල්' යන මේ දෙපදය
'පඩු තෙල්' හා සමස්වී—'ගොපඩු පොල්තෙල්'යි වේ.

INDECLINABLE COMPOUNDS.

අවිය සමස්.

107 අවිය සද මුල්වී—ඒ හා පරව නම් සද
සබඳව සමස්වන කල—එ අවිය සමස්නම් වේ.

108 'අව නි' යනවියසද—මුල්ව 'නඩු සරු' දෙක හා
එක්වී සබඳ විමෙන්—'අවනඩු නිසරු' යනු වේ.

COLLECTIVE COMPOUNDS.

දඅරුත් සමස්.

109 දකාරෙන් සබඳවන—පද සමුදු එ දකරන්
ලොප්වී සමස්වන්නේ—දඅරුත් සමස්නම් වේ.

110 'බඹද සුරද නරද'—ලොප්ව මෙයි ඇති දකරන්
'බඹසුරනරෝ'යයි ඒ—සමස් විදියෙන් සිදුවේ.

ADJECTIVAL COMPOUNDS.

වෙසෙසුන් සමස්.

111 එක් වනෙකම පිහිටි–වෙසෙසුන් වෙසෙස් යමරුත්
දෙපදයක් ගැළපීමෙන්—වෙසෙසුන් සමස් වන්නේ.

112 'රත්සඳුන්'මෙහි පද–දෙකොහි දෙඅරුත වෙන්නොව
එක් වනෙක්හිම වූයෙන්-වෙසෙසුන් සමස් නම් වේ.

RELATIVE COMPOUNDS.

අන්අරුත් සමස්.

113 සමස්පදයෙක සද—වසයෙන් හැමෙනරුත හැර
බැහැර අරුතක් පළවන-එ සමස් අන්අරුත් වේ.

114 'දසබල' මෙපදෙ 'දස'—යන්නෙන්ද 'බල' යන්නෙන්
කියනරුත් නොව ඉන් අන්—බුදු හී රුතොක්පළවේ.

RADICALS.

පි ය වි.

115 පද නිපැද්මට මූල්—වන්නේ පියවි නම් වේ
දපියවි සදපියවි—යනුවෙන් ඒ දෙබේ වේ.

116 'බලති මිනිස්සු' මේ—දෙපදයට මූල්වූ සද
'බල මිනිස්' යනුවේ ඒ—දෙක පියවිබැව් දන්නේ.

VERBAL ROOTS.

ද පි ය වි.

117 පදයොන් හෙවත් කිසි—කිරිය අරුතක් පළවන
පදන්හට මූල්වන සද—දපියවිනම් වන්නේ.

118 ලබදු ලැබිමෙහි—'ලබන්නෙමි' යන කිරියට
'ලබ'යන්න මුල වන්නේ—ඉන් ඒ දපියවි වේ.

NOMINAL ROOTS.

ස ද පි ය වි.

119 විබතෑනට ඇසිරු—පද හැම්ට මුල්වනුයේ
සදපියවිනම් වේ එහි—නිපන් ඈ බේ විමසව්.

120 'උට' යන මෙ සපදන්—විබත් රුව හි 'ගොනුටැ'සි
සිදුවන පෙදෙහි 'ගොන්'යනු-සදපියවිබැව් දන්නේ.

SUFFIXES.

පස.

121 පියවින් පරවැ කිසි—අරුතක් පිණිස විදිලෙස
ගළපන 'අගේ ඒ ඈ—අට ආන නි' ඈ පස.

122 'කෙරේ දෙඩමිට' යන-මෙහි 'කර දෙඩම්' යන මේ
පියවි සද දෙක අග දිසි—'ඒ අට' දෙකම පස වේ.

TRANSITIVE AND INTRANSITIVE VERBS.

අකම් සකම්.

123 දපද අකම්ද—සකම්ද පී මෙකෙමෙන්
මෙනමෙන ගණ දෙකක් වේ-එහිබේ පාම් සැකෙවින්.

ROOTS OF INTRANSITIVE VERBS.

අකම්ද.

124 යම් දපදයකින්—කිරියක් සිදුකරන්නට
කම්කරු වූවමනා නුව—නොහොත් ඒ අකම්ද වේ.

125 'ළමයෙක් හඬයි' මෙහි— 'හඬයි' යනු සිදුකරනාට
කම් වුවමනා නුයෙන්—එහි 'හැඬි' ද අකම් වේ.

ROOTS OF TRANSITIVE VERBS.

සකම්ද.

126 කිරියක් සැපයුමට—යම් කිසි දුපදයකින්
කම්කරු වුවමනා වී—නම් ඒ සකම්ද වේ.

127 'උා වැඩ කෙළේ' මෙහි—'කෙළේ' යනු සිදුකර නාට
වැඩ යන කමද යෙදුණෙන්-සකම් නම් වේ 'කර' ද.

THE THREE TENSES.

තෙකල්.

128 අයු අනා වත්මන්—වී තුන්වැදෑරුම් කල්
කිරිය පෙදෙකින් පලවේ—පස ඇ වෙසෙස විමසව්.

PAST TENSE.

අයුකල්.

129 යම් කිසි කිරියකින්—එහි කිය නිමි බැව් හෙවත්
කෙළවර බැව් හැගේනම්—අයුකල් වේ එ කිරිය.

130 'පෙරපින් කෙළෙමි' මෙහි-'කෙළෙමි' යන්නෙන් පින්කර
නිමවූ බැව් හැගෙන්නෙන්—අයුකල් එ කිරිය වේ.

PRESENT TENSE.

වත්මන් කල්.

131 කිරියෙකින් එහි කිය—පවතින බවක් හෝ ඒ
නොනිමි බැව් හඟනේනම්-වත්මන්කල් කිරියවේ.

132 'දැන් පින් කරමි' මෙහි—'කරමි' යන්නෙන් එහි කිය
නිමනු බැව් හැඟෙන්නෙන්—ඒ වත්මන් කිරියවේ.

FUTURE TENSE.

අනාකල්.

133 කිසි කිරිය පෙදෙකින්—ඇරඹු බවක් එහි කිය
නොහඟනේ නම් එ අනා-කල්කිරිය බැව් දන්නේ.

134 'මතු පින් කරන්නෙමි'—මෙහි කි පින කරන්නට
නොඇරඹුබව හැගෙන්නෙන්-එකිරිය අනාකල් දන්

THE THREE PERSONS.

තෙකරු.

135 අන්කරු තසදකරු—මසදකරු මේ තෙසදද
කිරියකින් පලවන බැව්—දන්නේ ඒ මෙසේ වේ.

THIRD PERSON.

අන්කරු.

136 හේ, ඔව්හු, ඈ අන්—කෙනාතුන් විසින් සපයන
සව් කිරියපද අන්කරු—සදනම් වෙති දන්නේ.

137 'හෙතෙමේ පින් කෙළේ'—'ඔව්හු දළද දුටුවෝ'
මෙහි 'කෙළේ දුටුවෝ'යනු-අන්කරුකිරියබැව් දන්.

SECOND PERSON.

තසදකරු.

138 තෝ, තෙප්, සි කියනුදු-අබිමුවෙහි සිටි කෙනාතුන්
පිළිබඳ කිරියපද හැම—තසදකරු සෙව්නේ වේ.

139 'තෝ පින් කෙරෙහි' 'තෙපි—දළද දකිව්' මෙහි වූ
'කෙරෙහි දකිව්' යනාදෙක-තසදකරුනම් වන්නේ.

FIRST PERSON.

ම ස ද ක රු.

140 මම, අපි, යන පදන්—හා යුත්වන කිරියපද
මසදකරු සෙව්නේ වේ—පස වෙසෙස විමසන්නේ.

141 'මම පින් කරන්නෙමි'—'අපි දළද දකින්නෙමු'
'කරනෙමි දකින්නෙමු'මේ-මසදකරු බැව් දන්නේ.

ACTIVE VOICE.

කතු කිරිය.

142 කිරියක් තමා කම—නොසියා කතු කියා නම්
ඒ කතුකරු කිරිය බැව්—දන්නේ හේ මෙසේ වේ.

143 'වෙළඳ, බඩු ගනී'—මෙහි 'ගනී' යන කිරියෙන්
කී බැවින් වෙළඳ ඒ—කතුකරු කිරිය වන්නේ.

CAUSAL MOOD.

පියඳු කිරිය.

144 තමන් නොමකොට අන්-කෙනාතුන් ලවා කිරියක්
කරවනු ලැබේනම් ඒ—පියඳු කිරිය වන්නේ.

145 “මම මිතුරකු ලවා—මල් කැඩවීමි” මෙහි කතු
මිතුරකු බැවින් පියදු—කිරියෙහි ‘කැඩවීමි’ යන්න.

IMPERATIVE MOOD.

විදිකිරිය.

146 කිරියක් කරන්නට—අදරින් හෝ අනදරින්
අණකිරි මෙහි යොදනේ—විදිකිරිය බැව් හඟනේ.
147 ‘සිමි තුඹ නොයන් දූන්’—‘සුරා පානය නොකරව්’
මෙහි නොයන්, නොකරව්, යනු—අණබැවින් විදිනාමවේ.

BENEDICTIVE MOOD.

ආසිකිරිය.

148 තොසඳහට අවැඩක්—වැඩක් හෝ වේවයි ඒ
පැතුමෙහි යොදන කිරියට—ආසිකිරියයි තෙපලත්.
149 ‘උඹ නසිවා’ ‘තෝ—රජවෙසිවා’ ‘මවද සුව
විඳිම්වා’ මෙහි නසිවා—වෙසිවා, ඈ ආසි වේ.

REPORTED ACTION.

අපසක්කිරිය.

150 ඉඳුරන්ට නොගොදුරු—කරුණක් පළකරනසල
යොදන කිරියට අපසක්—කිරියයි විදූ පඩුවෝ.
151 ‘අගතිසි මහමුනුඳු—දිය පිලු’ මෙන් දැක්වූ
පිලු යන මෙහි ලුසඳින්—අපසක් බවත් පළවේ.

PASSIVE VOICE.

කම් කිරිය.

152 කම්කරුහට අයත්—වනසේ කිරිය යෙදුවොත්
කම්පසනිපන් එකිරිය—කම්කරු කිරිය වන්නේ.
153 “මම පෙරනාව් විසින්—මැවූණෙම්” මෙහි මමැයි කී
කම්හට අයත් ‘මැවුණෙම්’—යනු කම්කිරිය වන්නේ.

CONDITIONAL MOOD.

අසබ්හව් කිරිය.

154 අනියමරුතක් හෝ—කල් අරුතක් හැඟෙනසේ
යොදත්හොත් එකිරියපද—අසබ්හව් යන නම් වේ.
155 වැස්සොත්, බැස්සාම—මින් හඟවන කිරියරුත්
අනියම් කල්අරුත් වෙති—එ කිරිය අසබ්හව් දන්.

PAST PARTICIPLE.

පෙර කිරිය.

156 වැකියක එකම කතු—සබඳවූ කිරිය අතුරෙන්
අපරකිරියෙන් පෙර සිදු—කිරියන් පෙර කිරිය දත්.

157 "ගොනා තණ කා දිය—බී නිදයි" මෙහි කෙළවර
කිරියෙන් පෙරතු 'කා බී'-යන දෙක පෙර කිරියවේ.

PRESENT PARTICIPLE.

මුසුකිරිය.

158 කිරියක් කරන්නා—එකෙරෙමින් අන් කිරියක්
කෙරේනම් ඒ කිරියට—මුසුකිරිය නම පැවසූ.

159 'ළදරුවා හඬමින්—කිරි බොයි' මෙවැකියෙහි වූ
'හඬමින්' යන කිරියපද—මුසුකිරියබැව් දන්නේ.

DERIVATIVES.

පසරුත් සද.

160 අරුතට නිසි පසන්—දපද සමග ගළපා
සිදුකර තුලබනා සද—පසරුත්සදයි දන්නේ.

161 එබඳු පස නාමෙනින්—පරව ගළපා ගැන්මෙන්
අන් කිසි නාමක් සිදුවූව—එද පසරුත් සදැයි දත්.

162 'පා' යන දපදින්—පරව 'ඇන්' යන පස ගෙන
ගළපා සිදුකෙළෙත් 'පැන්'-යන්න පසරුත් සදවේ.

163 'තොට' යන නමින් පර—'ඉ' යන පස ගැළපී වන
එහිනියුතු අරුතැති'තොටි'-යනු පසරුත් සදෙක්වේ

RELATION BETWEEN THE VERB AND SUBJECT.

වූත් අවුත්.

164 කිරියෙනින් කතු වූත්—වූවහොත් කම් අවුත් වේ.
නැතහොත් වූතුවූවොත් කම්—කතු අවුත්නම් වන්නේ.

165 'ගස කපමි' යන්නෙහි-'කපමි' යන්නෙන් 'මම' යන
කතු වූත් බැවින් එහි ඇති—'ගස' යන කම අවුත්වේ.

166 'මවිසින් ගස කැපිණි'-මෙහි'කැපිණි'යන කිරියෙන්
'ගස' යන්න වූත්වූයෙන්—'මා'යන කතු අවුත් වේ.

Relation Between the Subject and Attributes.

වෙසෙසුන් වෙසෙස්.

167 උස් මහත් ගුණ ඈ—වනන පද වෙසෙසුන් නාම්.
ඉන් වනානු ලබනා පද—වෙසෙස්නාම් වේ මෙහෙ මෙසේ.

168 'මහ කළු ගොනා' මෙහි-වනානු ලැබුයෙන් 'ගොන්' යනු
වෙසෙස් වේ 'මහ කළු' යනු-ගුණ බැවින් වෙසෙසුන් වේ.

Relation Between the Verb and Karakas.

කිරියකරුපදසබඳ.

169 "කම්කතු කරණ හා—සපදන් අවදි අදරද
මෙවියු විබත් සයටම—කරුනම් වියූ පඬුවෝ."

170 කරු නමැති මෙවිබත්—කිරිය හා ගැළපීමෙන්
කිරියකරුපදසබඳය—යෙදෙනා බැව් දැනගන්නේ.

171 "අරක්කැමි සැළියෙහි—කිරෙන් බත පිස සඟනට
දී මිදීණි සසරින්" යනා—මේ කිරියකරු සබඳය.

172 'වඳුරෝ ගසට යෙති'—'දරුවා පිළේ බත් කයි'
මෙවැනිද කිරිය කරුපද—සබඳයයි සලකන්නේ.

සඳබඳ යසපබඳ—විදුලකර පිරුවන්ගිම්
සිසුගණමිණිදමෙහි කිසි-උවඟසිරි ලැබැ පිනෙකින්,

සත්රසම්ලොලින්—බමන අතවැසි බිඟු වැළ
සේදවතු සත්සල්සරු—සෙසුගුරු හසුන් රක්මින්.

සුසිරිතට උරපා—පාමින් දුසිරිතට පිටු
ගම්වරැ වැසි වරාගොඩ—ඇම්. සී. පෙරේරා කළ.

එළු වියරණ හසර—නොමදත් සතට වැඩ වන
පදවිනිස පස්කැන් එව්—දුහුනකන් සරසාවා.

නිමි.

KOLLUPITIYA PRESS, COLOMBO.